# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1913/2 - 2015 මැයි මස 05 වැනි අඟහරුවාදා - 2015.05.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ 3 වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම,

(*අ*) ඉහත සඳහන් පනත යටතේ පළ කරන ලද 2015 මාර්තු මස 25 වැනි දිනැති අංක 1907/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද (දින 30 කට වඩා අධික කාලයක් වලංගුව පැවති) නියමය ඊට අයත් අංක "සං.ව. ශීර්ෂය 10.06" දරන වෙළඳ භාණ්ඩය සහ එහි අනුරූපී සටහන් වශයෙන් දක්වා ඇති "සං.ව. සංකේතය" "විස්තරය" සහ "විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද" ඉවත් කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ.

(*ආ*) ඉහත කී පනත යටතේ පනවන ලද 2015 මාර්තු මස 25 වැනි දිනැති අංක 1907/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත (දින 30 කට වඩා අධික කාලයක් වලංගුව පැවති) නියමය 2015 මැයි මස 06 දින සිට මෙයින් අවලංගු කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 මැයි මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

05 - 510


1A - PG 2454 — 506 (2015/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*